චක්‍රලේඛ අංක :04/2017

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ:ප:),
අංක 109 , හතර වන මහල,
මහ වීදිය,
බත්තරමුල්ල.
2017. /03/31

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ
අනෙකුත් සියලුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

## විනය පරීක්ෂණවලදී ගෙවීම්.

සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ 5:10:1 සිට 5:10:5 දක්වා වන වගන්ති සංශෝධනය කරමින් සහ 5:10:6 සිට 5:10:8 දක්වා වන වගන්ති අළුතින් ඇතුළත් කරමින් නිකුත් කරනු ලැබූ, සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ අංක: **05/2014** අවලංගු කර, එකී චක්‍රලේඛයේ සඳහන් වගන්ති වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කිරීම, බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බව කොමිෂන් සභා නියමය පරිදි මෙයින් දැනුම් දෙමි.

5:10:1 විනයානුකූල පරීක්ෂණ පැවැත්වීම වෙනුවෙන් කරනු ලබන ගෙවීම් 2017-03-01 දින සිට පහත සඳහන් පරිදි විය යුතුය.

| | පරීක්ෂණය පැවැත්වෙන පැයකට දීමනාව | ලිපිකරු/යතුරුලේඛක සහාය තැපැල් ගාස්තු වශයෙන් වැයවූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම | අවසාන වාර්තාව පිළියෙල කිරීම |
|---|---|---|---|
| විනය පරීක්ෂණ නිලධාරි<br>I. විශ්‍රාමික | රු.500 | රු.1500 | රු.5000 |
| II. රාජ්‍ය සේවයේ/ සංස්ථා සේවයේ නියුතුවූවන් | රු.450 | රු.1500 | රු.5000 |
| III. අදාල සමිතියේ සේවයේ නියුතුවූවන් | රු.450 | - | රු.5000 |
| පැමිණිල්ල මෙහෙයවන නිලධාරි | රු.400 | - | රු.2500 |

5:10:1:1 සමුපකාර සමිතිය විසින් ලිපිකරු / යතුරු ලේඛක සහාය හා තැපැල් ගාස්තු සපයනු ලබන්නේ නම් ඒ සඳහා වෙන්කර ඇති මුදල ලැබීමට හිමිකමක් නැත.

5:10:2 විනය පරීක්ෂණයකට අදාලව කාර්ය සටහන් යතුරුලියනය කිරීමේදී හෝ පරිගණකගත කිරීමේදී හෝ යතුරුලියන්නෙකුට පැයක කාලයක් සඳහා **රු.125/-ක දීමනාවක්** ගෙවිය යුතුය.

5:10:3 විනය පරීක්ෂණ / අභියාචනා පරීක්ෂණ යන කවර අවස්ථාවකදී වුවද පැමිණිල්ල මෙහෙයවන නිලධාරියාට ගෙවිය යුත්තේ ඉහත වගුගත පරිදිය.

5:10:4 ඉහත සඳහන් දීමනාවට අමතරව අභියාචනා පරීක්ෂණ නිලධාරියා / විනය පරීක්ෂණ නිලධාරියා/ මෙහෙයවන නිලධාරියා රජයේ හෝ සංස්ථා සේවයේ විශ්‍රාමිකයෙක් නම් ඔහු විශ්‍රාම යනවිට දැරූ තනතුර පදනම් කරගෙන ද, රජයේ හෝ සංස්ථා සේවයේ දැනට සේවයේ යෙදී සිටින නිලධාරියෙක් නම් ඔහු දරණ තනතුර පදනම් කරගෙන ද, රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබාගැනීමට හිමිකම් ඇත. අභියාචනා පරීක්ෂණ නිලධාරියා/ පැමිණිල්ල මෙහෙයවන නිලධාරියා / විනය පරීක්ෂණ නිලධාරියා සමුපකාර සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියෙකු නම් ඔහු විශ්‍රාම යනවිට දැරූ තනතුර පදනම් කරගෙන ද දැනට සමුපකාර සේවයේ නියුතු නිල

නිලධාරියෙකු නම් ඔහු දරණ තනතුර පදනම් කරගෙන ද සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබාගැනීමට හිමිකම් ඇත.

5:10:5 විනය පරීක්ෂණ නිලධාරියෙකු / පැමිණිල්ල මෙහෙයවන නිලධාරියෙකු පරීක්ෂණය සඳහා නියම කළ ස්ථානයට නියමිත දින නියමිත වේලාවට පැමිණය මුත් ඔහු වගකිව යුතු වන්නේ නැති විශේෂ කරුණක් පදනම් කරගෙන මෙම පරීක්ෂණ වෙනත් දිනකට කල් තබන්නේ නම් සම්පූර්ණ සැසියක් සඳහා ගෙවිය යුතු මුදලින් එක් අඩක් ඔහුට ගෙවිය යුතුය. සම්පූර්ණ සැසියක් යනුවෙන් හඳුන්වන්නේ පැය 8ක කාල සීමාවකි. එහෙත් පරීක්ෂණය පැය 4කට අඩු කාලයක් පවත්වා වෙනත් දිනකට කල් තබන්නේනම් මෙම සහනය හිමි වන්නේ නැත.

5:10:6 මාස 06ක කාලයක් ඇතුළත විනය පරීක්ෂණය අවසන් කර, අවසන් වාර්තාව විනය බලධාරියා වෙත භාරදෙන්නේනම්, ඉහත

5:10:1 ඡේදයේ සඳහන් සියළු දීමනාවලට අමතරව, රු.5,000/- ක දීමනාවක් ලබා ගැනීමට ද විනය පරීක්ෂණ නිලධාරියාට හිමිකම් ඇත.

5:10:7 යම්කිසි විශේෂිත හේතුවක් පදනම් කරගෙන පරීක්ෂණයේ වාර්තාව ලබා දීමට මාස 06ට වඩා ප්‍රමාද වන්නේනම්, අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ මත කොමිෂන් සභාවේ ලිඛිත අනුමැතිය ඒ සඳහා ලබා ගෙන **ඇත්නම් මිස,** විනය පරීක්ෂණ නිලධාරියාට ඉහත 5:10:1 සහ 5:10:6 හි සඳහන් දීමනාවලින් පහත සඳහන් ආකාරයට අඩු කර ගෙවිය යුතු වේ.

I. මාස 06කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනාවලින් 5%ක්
II. මාස 09කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනාවලින් 10%ක්
III. මාස 12කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනාවලින් 25%ක්

කොමිෂන් සභා නියමය පරිදිය.

එස් ඒ .එල්.රංගනි,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

1. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
2. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත.
4. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ ගම්පහ/ කළුතර)
5. අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.
6. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව.
7. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
8. සියළුම වෘත්තීය සමිති සංගම්